චක්‍රලේඛ අංකය -**SP/DSP-ENV/12/17**

2017 මැයි මස 15 වන දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2017 ජූනි 05

ඈත අතීතයේ සිටම මිනිසා හා පරිසරය අතර වෙන් කළ නොහැකි බැඳීමක් පැවතුණු අතර වර්තමානයේ මිනිසාගේ නොයෙකුත් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වන පාරිසරික වෙනස්කම් සමස්ත ජීවීන්ගේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇත. සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමඟ මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සීමිත සම්පත් අවිධිමත් ලෙස පරිභෝජනය කිරීම තුළින් ගෝලීය උෂ්ණත්වය ඉහළයාම, දේශගුණ විපර්යාස, හරිතාගාර ආවරණය, පාංශු හායනය, ජල මූලාශ්‍ර විනාශවීම ආදී පාරිසරික ගැටලු රැසක් උද්ගත වී ඇත. මිනිසාගේ සහ අනෙකුත් ජීවීන්ගේ යහපැවැත්ම උදෙසා සොබාදහම සමඟ වූ සබැඳියාව තිරසර ලෙස පවත්වා ගැනීම සඳහා පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව මේ වන විට ලෝකවාසී ජනතාවගේ විශේෂ අවධානයක් යොමු වී ඇත.

02. ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී 1972 වර්ෂයේ පැවති ජාත්‍යන්තර පරිසර සමුළුවේහිදී ගන්නා ලද තීරණයකට අනුව බිහි වූ එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) සමාරම්භක දිනය සැමරීම උදෙසා, සෑම වසරකම ජූනි 05 ජගත් පරිසර දිනය වශයෙන් නම් කර ඇත. පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමට හා පාරිසරික ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීමේ අරමුණින්, එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමා යටතේ ජගත් පරිසර දිනය සමරනු ලබයි. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙම වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස **“Connecting People to Nature”** යන්න ඉදිරිපත් කර ඇත. ඒ අනුව **“සොබා දහම හා බැඳුණු ජනතාවක්”** යන තේමාව යටතේ අප රට ද මෙම වසරේ ජගත් පරිසර දිනය සමරනු ලැබේ.

03. “ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන” යන මැයෙන් යුතුව 2016 අප්‍රේල් 28 දින ගරු මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා වශයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව සෑම වසරකම ජුනි 05 දින ජගත් පරිසර දිනය සැමරීමටත් ඊට පූර්ව සතිය “ජාතික පරිසර සතිය” ලෙසින් නම් කර පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ.ඒ අනුව මෙම වර්ෂයේ ද මැයි 29 සිට ජුනි 04 දක්වා පූර්ව සතිය **“ජාතික පරිසර සතිය”** ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඊට සමගාමීව ජගත් පරිසර දින සැමරුම් ජාතික උත්සවය ජුනි 05 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය කෙරේ.

04. ඒ අනුව සියළුම ආයතනවල ප්‍රධානීන් විසින් තම කාර්ය මණ්ඩලය ද, විදුහල්පතිවරුන් විසින් තම විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, කාර්යාල හා පාසල් පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, කසළ වර්ගීකරණය කර (ප්ලාස්ටික්/ පොලිතීන් / කඩදාසි / වීදුරු / ලෝහ / කාබනික ද්‍රව්‍ය ආදී ලෙස) බැහැර කිරීම ආරම්භ කර පවත්වාගෙන යාම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

05. එසේම දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ පරිසරය පවිත්‍ර කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

06. තවද ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, රාජ්‍ය නොවන සංවිධාන, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, පෞද්ගලික අංශය, සිවිල් සංවිධාන මූලිකත්වය ගෙන ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

i. ලස්සන, පිරිසිදු රටක් නිවසින් ආරම්භ කිරීමේ වැදගත්කම සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම සඳහා ජනතාව දැනුවත් කිරීම
ii. නීල හරිත ලස්සන ලංකා වැඩසටහන යටතේ පරිසර හිතකාමී “නීල හරිත ගම්මාන” වැඩසටහන ක්‍රියාත්මක කිරීම
iii. වස විස නැති කාබනික ගොවිතැන ප්‍රවර්ධනය කිරීම
iv. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
v. සෞඛ්‍යාරක්ෂිත මුළුතැන්ගෙයක් පවත්වා ගැනීමට උපකාරී වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
vi. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය ප්‍රවර්ධනය
vii. වන ආවරණය ඉහළ නැංවීමට ක්‍රියාකිරීම හා ග්‍රාමීය මට්ටමින් සහ ආයතන මට්ටමින් රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා පැළ තවාන් ඇති කිරීම
viii. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනාගෙන සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ix. පාංශු සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
x. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම
xi. හානියට පත් භූමි පුනරුත්ථාපනය කිරීම
xii. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම හා වෙරළ කලාපය පවිත්‍ර කිරීම

07. ජාතික පරිසර සතිය තුළ සුවිශේෂ අරමුණු ඉටුකර ගැනීම සඳහා එක් එක් දිනයන් පහත පරිදි නම් කර ඇත.

| | |
|---|---|
| මැයි 29 | පරිසරය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය |
| මැයි 30 | පරිසරය පවිත්‍ර කිරීමේ දිනය |
| මැයි 31 | කසළ කළමනාකරණ දිනය |
| ජුනි 01 | රුක් රෝපණ දිනය |
| ජුනි 02 | ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය |
| ජුනි 03 | ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය |
| ජුනි 04 | තිරසර ඉඩම් කළමනාකරණ දිනය |
| ජුනි 05 | ජගත් පරිසර දිනය |

08. සෑම ආයතනයක් විසින්ම ඉහත යෝජිත වැඩසටහන් හා සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වමි.

09. එම සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය, ජනාධිපති කාර්යාලයේ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන වෙත වාර්තා කළ යුතු අතර ඉදිරි වර්ෂයන්හිදී ජාතික පරිසර සතිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් එම වැඩසටහන් තම ආයතනවල, පළාත්වල හා දිස්ත්‍රික්කවල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

10.පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

**පී.බී.අබේකෝන්**
ජනාධිපති ලේකම්

පිටපත්

01. අග්‍රාමාත්‍ය ලේකම් - දැ.ගැ.ස.
02. අමාත්‍ය මණ්ඩල ලේකම් - දැ.ගැ.ස.